ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2022-09-08

පැමිණිලි පාර්ශවය : එච්.එම්.පී. හේරත් මයා,
තාක්ෂණ විද්‍යාල නිල නිවාස,
සුමංගල මාවත,
කුරුණෑගල.

වගඋත්තර පාර්ශවයන් : 1. විදුහල්පති,
කු/මලියදේව බාලිකා විද්‍යාලය,
කුරුණෑගල.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය :</u> **<u>HRC/K/95/21-ඒ</u>**

**පැමිණිල්ලි පාර්ශවයේ සැලකීරිම :-**

ඉහත නම් සඳහන් පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමාගේ දියණිය 2021 වසරේ පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරිමේ අරමුණින් කුරුණෑගල මලියදේව බාලිකා විද්‍යාලයට 'රජයේ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම' ගණය ඔස්සේ අයදුම් කළ බවත්, ඊට අදාළ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමෙන් පසු ලකුණු 81 ක් ලබාගනිමින් පොරොත්තු ලේඛනයේ දෙවන ස්ථානයේ රැඳී සිටි බවත්, අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයෙන් පසුව තම දියණිය පොරොත්තු ලේඛනයේ පළමු ස්ථානයේ රැඳී සිටි බවත්, නමුත් තම දියණියට පාසලට ඇතුළත් වීමට අවස්ථාව නොලැබීම තුළින් දැඩි අසාධාරණයක් සිදු වූ බව තමාගේ හැඟීම බවත්ය.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

මෙහිදී රජයේ අවශ්‍යතා මත ස්ථානමාරුවීම් ගණය ඔස්සේ මෙම පාසලට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව 06 දෙනකු වන අතර, සම්මුඛ පරික්ෂණයේ ලකුණු ලබාදීමේ පිළිවෙල මත තාවකාලික සුදුසුකම් ලැබූවන්ගේ ලේඛනය ප්‍රකාශයට පත්වූ බවත්, එහි අනු අංක 02 සහ යොමු අංක 13 හි නම් සඳහන් පි.එම්.කේ.එම්. කුමාර මහත්මා ලබා ඇති ලකුණු පිළිබඳ ගැටළු සහගත තත්වයක් පැවති හෙයින්, එතුමා හට තමා සහ තවත් අය විසින් විරෝධතාවයන් ඉදිරිපත් කරන ලද බවත්, විරෝධතා මණ්ඩලයේදී මේ පිළිබඳ තවදුරටත් කරුණු ඉදිරිපත් කළ අතර, එම කරුණු සැළකිල්ලට ගෙන සුදුසුකම් ලැබූවන්ගේ ස්ථිර ලේඛනයේදී ඔහුගේ ලකුණු 98 සිට 91 දක්වා අඩු කර ඇති බවත් දක්වා ඇත.

නමුත් තමා විසින් සොයා ගත් කරුණු සහ විරෝධතා මණ්ඩලයට ඉදිරිපත් කළ කරුණු මත 'පෙර සේවා ස්ථානයේ කලත්‍රයා හා ළමයා සමඟ පදිංචිව සිට නව සේවා ස්ථානයට පැමිණිය යුතුය' යන නිර්ණායකය සම්පූර්ණ කර නොමැති හෙයින් එම අයට මෙම ගණය යටතේ අයදුම් කිරීමට පවා හැකියාවක් නොමැති බවත්, එසේ ඉදිරිපත් වුවද පී.එම්.ජේ.කේ.එම්. කුමාර මහත්මා හිමි කරගතයුතු ලකුණු ප්‍රමාණය නියත වශයෙන්ම 88 ක් හෝ ඊට පහළ අගයක් විය යුතු බවත් ඒ සඳහා හේතු පාදක වූ නිර්ණායකයන් තමා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන බවත් දක්වා ඇත.

ඒ අනුව,

| | උපදෙස් පත්‍රිකාවේ සඳහන් නිර්ණායක | හේතු වූ කාරණය | අහිමි වන ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | 6.5 (ආ) 1 හි සඳහන් පරිදිපෙර සේවා ස්ථානය සහ නව සේවා ස්ථානය අතර දුර | තඹලමුව පොලිස් ස්ථානයේ සිට කුරුණෑගල පොලිස් ස්ථානයට දුර කි.මී. 140 | 07 |
| 02 | 6.5 (ආ) 1 හි සඳහන් පෙර සේවා ස්ථානයේ සේවය කල කාලය | **<u>සේවා විස්තර</u>**<br>බෙන්තොට පොලිස් ස්ථානය<br>2014.09.31 දින සිට 2015.12.31 දින දක්වා පොල්ගහවෙල පොලිස් ස්ථානය 2016.01.01 දින සිට 2018.03.01 දින දක්වා | 05 |
| | | තඹලගමුව පොලිස් ස්ථානය<br>2018.03.02 දින සිට 2020.01.14 දින දක්වා (සේවා කාලය වසර 01 මාස 09 දින 12) | 03 |
| | | කුරුණෑගලව පොලිස් ස්ථානය<br>2020.01.15 දින සිට මේ දක්වා | |
| | තමා විසින් සොයා ගත් තොරතුරු මත පි.එම්.ජේ.කේ:එම්. කුමාර මහතා හට උපදෙස් පත්‍රිකාව අනුව අහිමි වන ලකුණු ප්‍රමාණය | | 12 |

ඉහත සඳහන් කරන ලද තොරතුරු ඉතා නිවැරදි තොරතුරු වන අතර, පාසල විසින් ප්‍රකාශයට පත් කරන පැසලට ඇතුළත්වීමට සුදුසුකම් ලැබූවන්ගේ ස්ථිර ලේඛනයේදි ඔහුගේ ලකුණු 88 ක් හෝ ඊට පහල අගයක් ලෙසින් සංශෝධනය විය යුතුව තිබූ බවත්, අදාළ නිර්නායක සනාථ කිරිම උදෙසා ව්‍යාජ ලිපි ලේඛන ඉදිරිපත් කර තිබිම හෝ එසේ නොමැතිනම් සම්මුඛ පරික්ෂණ මණ්ඩලය සහ අභියාචනා/ විරෝධතා මණ්ඩලය මෙතුමා වෙත පක්ෂග්‍රාහි අයුරින් කටයුතු කර තිබීම එසේ වීමට හේතු වූවා විය හැකි බවත් සඳහන් කර ඇත.

අයදුම්පත් යොමු කරන අවස්ථාවේදි අයදුම්කරුවන් විසින් පාසල වෙත යොමු කරන ලද තොරතුරු මත පදනම්ව, පාසල විසින්ද යම් සොයා බැලීමකින් අනතුරුව සම්මුඛ පරික්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවනු ලබන අතර, එහිදි අදාළ තොරතුරු 100% ක් තහවුරු තර ගැනීමක් සිදුවූ බවත්, එම අවස්ථාවේ ව්‍යාජ තොරතුරු සැපයීම හෝ එම තොරතුරු තහවුරු කිරිම අයදුම්කරුවන් විසින් සිදු කරන බරපතල වරදක් බවත්,එසේ සිදුකර තිබෙ නම් ඔවුන් ලේඛනයෙන් ඉවත් විය යුතු බවත්, සම්මුඛ පරික්ෂණයේදි සිදුව ඇති වරදක් 100% කින් නිවැරදි කර ගැනීම අභියාචනා/විරෝධතා මණ්ඩලයකින් සිදු විය යුතු කාර්යභාරයක් බවත්, මෙහිදි විරෝධතාවන්හිදි යොමුවන කරුණු තහවුරු කර ලකුණු අඩු කිරිම නිවැරදිව සිදුව නොමැති අතරම, ලකුණු අඩු කිරිම නොව මෙහිදි සිදුවිය යුත්තේ සම්මුඛ පරික්ෂණයේදි තහවුරු කළ තොරතුරු ව්‍යාජ හෝ වැරදි සහගත නම් ඔවුන් ලේඛනයෙන් ඉවත් කිරිම බවත්, වැඩිදුරටත් දක්වා ඇත. ඒ අනුව මෙම අයදුම්පත ප්‍රතික්ෂේප වූයේ නම් පොරොත්තු ලේඛනයේ පළමු ස්ථානයේ රැඳී සිටි තම දියණිය හට එම අවස්ථාව නිතැතින්ම හිමිවන බවද පැමිණිල්ලෙන් දක්වා ඇත.

ඒ අනුව අසත්‍ය ලේඛන ඉදිරිපත් කරමින් සම්මුඛ පරික්ෂණයට ඉදිරිපත් වූ පි.එම්.ජ්.කේ.එම්. කුමාර මහත්මයාගේ නම සුදුසුකම් ලැබූවන්ගේ ස්ථිර ලේඛනයේ තිබිම හේතුවෙන් නිවැරදි හා සත්‍ය ලේඛන ඉදිරිපත් කළ පොරොත්තුවේ අංක 01 ලෙස රැඳී සිටින මීළඟට පාසලට ඇතුළත් වීමට ලකුණු හිමිකරගෙන තිබූ තමාගේ දියණිය හට දැඩි අසාධාරණයක් සිදුවී ඇති බැවින් මෙම කාරණය පිළිබඳ විමර්ශනයක් පවත්වා හෝ මෙම අභියාචනය පිළිබඳ සලකා බලා කු/මලියදේව බාලිකා විදුහලට තමාගේ දියණිය ඇතුළත් කිරිමට අවශ්‍ය කටයුතු සිදුකර ඉටුකර දෙනමෙන් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම :-**

පැමිණිල්ලේ වගඋත්තර පාර්ශවය වාර්තාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාර පි.එම්.කේ.එම්. කුමාර මහතා විසින් සම්මුඛ පරික්ෂණයේදි හා අභියාචනා/විරෝධතා මණ්ඩලයේදි ලබා ගත් ලකුණු පහත පරිදි වන බවයි.

| නිර්ණායක | සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු | අභියාචනා මණ්ඩලයේ ලබා ගත් ලකුණු |
|---|---|---|
| 6.5 (ආ) I පෙර සේවා ස්ථානයේ සිට නව සේවා ස්ථානයට ඇති දුර | 35 | 28 |
| 6.5 (ආ) II පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය | 30 | 30 |
| 6.5 (ආ) III රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල/රාජ්‍ය බැංකු සේවකයෙකු ලෙසසේවා කාලය | 10 | 10 |
| 6.5 (ආ) IV පෙර සේවා ස්ථානයේ සේවය කළ කාල සීමාව | 05 | 08 |
| 6.5 (ආ) V ස්ථාන මාරුවීම් ලැබ ගතවූ කාලය | 05 | 05 |
| 6.5 (ආ) VI ලබා නොගත් නිවාඩු | 10 | 10 |
| ලබා ගත් සමස්ථ ලකුණු ප්‍රමාණය | 98 | 91 |

එම මහතා සමුම්බ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබූ ලිපි ලේඛන තහවුරු කර ගනිමින් ඉහත 6.5 (ආ) I සඳහා ලකුණු 35 ක් ලබා දුන්නද, පසුව ඉදිරිපත් කර තිබූ විරෝධතා සලකා බලා අභියාචනා/විරෝධතා මණ්ඩලය විසින් තවදුරටත් එම ලේඛන තහවුරු කර බලා පෙර සේවා ස්ථානය කන්තලේ පොලිස් කොට්ඨාශය සේ සලකා කන්තලේ සිට කුරුණෑගලට ඇති දුර සඳහා ලකුණු 28 ක් ලබාදෙන ලද බවත්,

තවද තහවුරු කර ගත් ලේඛන අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා/විරෝධතා මණ්ඩලය විසින් ඉහත 6.5(ආ) සඳහා 2018.01.15 සිට 2020.01.16 දක්වා කාලසීමාව එම මහතාගේ පෙර සේවා ස්ථානයේ සේවය කළ කාලය ලෙස තහවුරු කර ලකුණු 8 ක් ලබා දෙන ලද බවත්, ඒ අනුව සමස්ත ලකුණු ප්‍රමාණය 91 ක් වූ බවත්, මෙයට අමතරව අයදුම්කරු දියණිය සමඟ පදිංචි සිට ස්ථාන මාරු ලැබූ බවට අදාළ ග්‍රාම නිලධාරී විසින් තහවුරු කර ඇති බවත්, දක්වා ඇත.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා/විරෝධතා මණ්ඩලය විසින් මෙම ලිපි ලේඛන සියල්ල නිවැරදි බව මුලස්ථ සේවා ස්ථානය මඟින් තහවුරු කර ගෙන ඇති බැවින් ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර ඇති බවට නඟන චෝදනාව පදනම් විරහිත බවත්, ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හෝ අභියාචනා /විරෝධතා මණ්ඩලය විසින් අදාළ අයදුම්කරුට පක්ෂපාති ලෙස කටයුතු කර නොමැති බවත්, නිවැරදි ලකුණු ලෙස 91 ලබා දීම නිවැරදි බවත් දක්වා ඇත.

**පරීක්ෂණ හා විමර්ශන කටයුතු වලින් අනාවරණය වන කරුණු :-**

පැමිණිලිකරුගේ දියණිය 2021 වර්ෂයේ 1 වන ශ්‍රේණියට කුරුණෑගල මලියදේව බාලිකා විද්‍යාලයට ස්ථාන මාරු පදනම යටතේ අයදුම්කරුගේ දියණිය ලකුණු 81 ක් ලබා අවසන් පොරොත්තු ලේඛනයේ 02 වන ස්ථානයට පැමිණ ඇත.

පොරොත්තු ලේඛනයේ 1 වන ස්ථානයට පත්ව ඇති එස්.එම්.ඩී.ආර් සමරකෝන් දියණිය ලකුණු 91 ක් ලබා දී ඇති අතර, ඇයගේ පියාවන අයදුම්කාර පී.එම්.ජේ.කේ.එම් කුමාර යන අය දියණිය අදාළ පාසලට ඇතුළත් කරගැනීම සඳහා ඉදිරිපත් කර ඇති තොරතුරු හා ලේඛන ව්‍යාජ බව තහවුරු වේ.

එනම්, එම අයදුම්කාර පී.එම්.ජේ.කේ.එම් කුමාර යන අය කුරුණෑගල කොට්ඨාශයේ සිට කන්තලේ කොට්ඨාශයට ස්ථානමාරුවීම් ලබා ඇත්තේ, 2017.01.15 දින සිට වන අතර, පොලිස්පතිගේ 2016.12.19 දිනැති ස්ථාන මාරුවීම් නියෝග දීර්ඝකිරීම යටතේ ස්ථාන මාරුව 2018.01.15 දිනයේ සිට ක්‍රියාත්මක කිරීමට නියම කර ඇති බව නිරීක්ෂණය වේ. එහෙත් පී.එම්.ජේ.කේ.එම් කුමාර මහතා සත්‍ය ලෙසම කන්තලේ කොට්ඨාශයෙන් තඹලගමුව පොලිස් ස්ථානය වෙත වාර්තා කර ඇත්තේ, 2018.03.03 වන දින සිට වේ. එහෙත් තඹලගමුව පොලිස් ස්ථානාධිපතිවරයා විසින් නිකුත් කර ඇති 2020.09.18 දිනැති සේවා සහතිකයේ අදාළ නිලධාරියා 2018.01.15 දින සිට තඹලගමුව පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කළ බව සහතික කර ඇති අතර, ඒ අනුව එය අසත්‍ය ලේඛනයක් බවට නිරීක්ෂණය වේ.

තවද ගෝමරන්කඩල පොලිස් ස්ථානාධිපතිවරයා විසින් නිකුත් කර ඇති 2020.01.16 දිනැති සේවා සහතිකයේද පී.එම්.ජේ.කේ.එම් කුමාර මහතා 2017.01.15 දින සිට ගෝමරන්කඩවල පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කළ බවට සහතික කර ඇති නමුත් සත්‍ය ලෙසට ඒ මහතා ගෝමරන්කඩවල පොලිස් ස්ථානයට වාර්තා කර ඇත්තේ 2019.12.16 දින වේ. ඒ අනුව එම සේවා සහතිකයද අසත්‍ය ලේඛනයක් බවට නිරීක්ෂණය වේ.

පී.එම්.ජේ.කේ.එම් කුමාර මහතා තාවකාලික පදිංචිය සනාථ කර ගැනීම සඳහා 2020.09.08 දිනැතිව ඉදිරිපත් කර ඇති ග්‍රාම සේවා සහතිකයේද කන්තලේ කොට්ඨාශයට 2018.01.15 දින සිට ස්ථාන මාරුවීම් ලබා පැමිණ බිරිඳ හා දියණිය සමඟ අංක 540, 5 කණුව, ගෝමරන්කඩවල යන ලිපිනයේ තාවකාලිකව පදිංචිව සිටි බවට සහතික කර ඇති අතර, එහි 2018.01.16 දින සිට අදාළ ලිපිනයේ පදිංචිව සිටි බව සඳහන් වේ. එහෙත් පී.එම්.ජේ.කේ.එම් කුමාර මහතා 2019.12.16 දින ගෝමරන්කඩවලට අනුයුක්ත වන්නේ නම්, 2018.01.16 දින සිට ගෝමරන්කඩවල ඉහත ලිපිනයේ පදිංචිව සිටි බව සහතික කිරීම ගැටළු සහගත බවද නිරීක්ෂණය වේ.

2021 වර්ෂයට දරුවන් ඇතුළත් කරගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය 2020.06.30 දින වන අතර, පී.එම්.ජ්.කේ.එම් කුමාර යන අය අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ග්‍රාම නිලධාරී සහතිකය හා තඹලගමුව පොලිස් ස්ථානාධිපතිගේ සේවා සහතිකය 2020.09.18 දිනැතිව ලබාගෙන අයදුම්පත සමඟ ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැත. ඒ අනුව අදාළ ලේඛන පසුව ඉදිරිපත් කර ඇති අතර, චක්‍රලේඛනය අනුව ලේඛන පසුව ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැත.

මෙම කරුණු අනුව, පී.එම්.ජ්.කේ.එම් කුමාර යන අයගේ පෙර සේවා ස්ථානයේ සේවා කාලය වසර 2 සිට 3 ට අඩු ලෙස සලකා (ව්‍යාජ ලේඛන අනුව) ලකුණු 08 ක් ලබා දී තිබුනද, සත්‍ය ලෙසම සේවා කාලය වසර 7 සිට වසර 2 ට අඩු ලෙස සලකා ලබාදිය යුත්තේ ලකුණු 05 කි. ඒ අනුව ඔහුගේ ලකුණු ප්‍රමාණය 88 ක් විය යුතුව පවතින බවද කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

නමුත්, ඉහත අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ලේඛන අසත්‍ය ලේඛන බවට කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වන අතර, පාසල් වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කරගැනීමේ චක්‍රලේඛයේ 7.1.3 ප්‍රකාරව ‘සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛන වලින් එක් ලේඛනයක් හෝ නීත්‍යානුකූල නොවන හෝ ව්‍යාජ ලේඛනයක් වන්නේ නම් එම හේතුව නිසාම අයදුම්පත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කළ හැකිය’ වශයෙන් දක්වා ඇත. ඒ අනුව ඉහත කී පී.එම්.ජ්.කේ.එම් කුමාර යන අයගේ අයදුම්පත ප්‍රතික්ෂේප විය යුතුව තිබූ අයදුම්පතක් බවට කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වී ඇත. ඒ අනුව මෙම අයදුම්පත ප්‍රතික්ෂේප වූයේ නම් පොරොත්තු ලේඛනයේ පළමු ස්ථානයේ රැඳී සිටි පැමිණිලිකරුගේ දියණිය හට එම අවස්ථාව හිමිවිය යුතුව පැවැති බවද කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

නිගමනය :-

ඉහත කරුණු අනුව පෙනී යන්නේ, 1 වන ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීමේ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛනයට පටහැනිව අයදුම්කරුවෙකු විසින් පසුව ඉදිරිපත් කර ඇති ව්‍යාජ ලිපිලේඛන භාරගෙන එම අයගේ දියණිය පාසලට ඇතුළත් කරගැනීම මඟින්, පැමිණිලිකරුගේ දියණිය හට කෑ/ මලියදේව බාලිකා විද්‍යාලයේ 2021 වර්ෂයේ පළමු වසරට ඇතුළත් වීමට තිබූ අවස්ථාව වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් අහිමිවී ඇති බවයි. එමගින් පැමිණිලිකරුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බව මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී හෙළිදරව් වී ඇත. එබැවින් පැමිණිලිකරුගේ දියණිය වන එච්.එම්.එස්.එස් හේරත් දියණිය කු/මලියදේව බාලිකා විද්‍යාලයේ දෙවන ශ්‍රේණියට ඇතුළත් කිරීම උචිත බැවින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට අධ්‍යක්ෂ (ජාතික පාසැල්) වෙත මෙහි පිටපතක් යොමු කරනු ලැබේ.

2022. 10 . 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අධ්‍යක්ෂ (ජාතික පාසැල්),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල. } ඉහත නිර්දේශය අනුව කටයුතු කිරීමට

02. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය, නුවර.

B/